සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.s/20 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2024.03.15 |
|---|---|---|---|---|---|

WBB/Circular/No -02/2024

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන්
සහ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් /නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත

**අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය යටතේ වැඩිහිටිආබාධිත හා, වකුගඩු රෝගී දීමනා ගෙවීමේ ක්‍රියාවලිය**

01. 2002 අංක 24 දරණ සුබසාධක පනත යටතේ අනුමත කර ඇති අංක 2328/13 දරණ 2023.04.21 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ තෝරා ගනු ලැබූ සුදුසුකම්ලාභි පවුල් වලට අයත් හඳුනා නොගත් වකුගඩු රෝගී, ආබාධිත හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ප්‍රතිලාභ දීමනා ගෙවීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව පහත උපදෙස් ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ඉහත සඳහන් සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයේ I වන උපලේඛනය යටතේ සුදුසුකම් ලබන තැනැත්තන් හඳුනා ගෙන ප්‍රතිලාභ ගෙවීම සඳහා පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුයි.

03. අස්වැසුම සුදුසුකම්ලාභි පවුල්වලට අදාළව ඉදිරිපත්ව ඇති තොරතුරු පරික්ෂා කර දැනටමත් වකුගඩු රෝගී හා ආබාධිත, දීමනා ලබන බවට ඉදිරිපත්ව ඇති පුද්ගලයන් සහ දීමනාවක් නොලබන්නේ වුවද එවැනි තත්වයක පසුවන බවට සපයා ඇති තොරතුරු හඳුනා ගෙන වෙන්කර ගත යුතුයි. වයස අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටි පුද්ගලයින් පිළිබඳ තොරතුරු පරිගනක පද්ධතිය තුළින්ම ලබාගත යුතුයි.

04. **හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගී ,ආබාධිත තැනැත්තන් හා වැඩිහිටි තැනැත්තන් හඳුනා ගැනීම :-**

4.1. සුදුසුකම් ලබන හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගීන් හඳුනා ගැනීම :-

පහත සඳහන් සාධක මත සුදුසුකම් ලබන සමාජ කාණ්ඩවලට අයත් මෙවැනි තැනැත්තන් හඳුනාගත යුතුවේ.

අ) මාසයක් ඇතුළත අවම වශයෙන් වාර දෙකකදී eGFR අගය 90ට අඩුවෙන් ඇති බවට වාර්තා වූ වකුගඩු රෝගීන් වීම.ඒ සඳහා වෛද්‍ය තාක්ෂණික වාර්තාවක්(Test Report) ඉදිරිපත් කළ යුතුයි.

ආ) රෝගියාට ප්‍රතිකාර කරනු ලබන වෘක්කවේද විශේෂඥ වෛද්‍යවරයෙකු වෙතින් ලබා ගන්නා වෛද්‍ය වර්තාවක් මගින් එවැනි හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගියෙකු බව තහවුරු වීම.

Scanned with CamScanner

4.2 සුදුසුකම් ලබන ආබාධිත පුද්ගලයින් හඳුනා ගැනීම :-
පහත සඳහන් සාධක මත සුදුසුකම් ලබන සමාජ කාණ්ඩවලට අයත් ආබාධිත පුද්ගලයින් හඳුනා ගත යුතුවේ.

අ) විකලාංග විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් ආබාධිත තැනැත්තා ගේ ආබාධිත තත්වය සනාථ කරමින් නිකුත් කරනු ලබන සහතිකයක්.

ආ) ආබාධිත පුද්ගලයාට තම එදිනෙදා කටයුතු වෙනත් කෙනෙකුගේ ආධාර නැතුව ආධාරක උපකරණයක් භාවිතයෙන් පවා ඉටුකරගත නොහැකි බවට විකලාංග වෛද්‍යවරයෙකු විසින් සහතික කර ගැනීම.

4.3 අස්වැසුම සමාජ කාණ්ඩවලට අයත් සුදුසුකම් ලබන වැඩිහිටි පුද්ගලයින් හඳුනා ගැනීම:-
අ) ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුයි.
ආ) ග්‍රාම නිලධාරින්ගේ සහතිකයක් මගින් දැනට වයස අවුරුදු 70 ඉක්මවූ දැනට ජීවත්වන පුද්ගලයෙකු බව සනාථ කර ගැනීම.

**05. අස්වැසුම ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩවලට ඇතුළත් හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගීන්,ආබාධිත පුද්ගලයින් හා වැඩිහිටි දීමනා ලැබීමට සුදුසු පුද්ගලයින් තෝරා ගැනීම -**

5.1 දැනට තෝරා ගෙන ඇති කුමන හෝ අස්වැසුම සමාජ කාණ්ඩයක් යටතේ සුදුසුකම් ලබා ඇති පවුල් තුළ සිටින 4වන ඡේදයේ සඳහන් අර්ථකථනය අනුව සුදුසකම් ලබන බවට අදහස් කරන සියළු තැනැත්තන්ට පහත සඳහන් ලිපිලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කරන ලෙස දැන්විය යුතුයි.

i. අස්වැසුම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේදී ලබා දී ඇති QR කේතය.
ii. වකුගඩු රෝගීන් සඳහා අදාළ වෛද්‍ය තාක්ෂණික වර්තාව.
iii. ඉහත 4 ඡේදයේ සඳහන් අදාළ වෛද්‍ය වාර්තාව.
iv. උප්පැන්න සහතිකය හා ග්‍රාම නිලධාරි සහතිකය (වැඩිහිටි සඳහා පමණක් අදාළ වේ.)

5.2 එසේ ලබා ගන්නා ලිපිලේඛන වල අඩංගු අවශ්‍ය තොරතුරු පරිගනක පද්ධතියට ඇතුළත් කිරීමට සුබසාධක ප්‍රතිලාභ ඒකකය මගින් ප්‍රාදේශීය ලේකම්වරුන් පියවර ගත යුතුයි. ඒ සඳහා සමාජ සේවා නිලධාරින්ගේ, වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරින්ගේ හා ආබාධිත මහලේකම් කාර්යාලයෙන් අනුයුක්ත යම් නිලධාරියෙක් වෙත් නම් එම නිලධාරියාගේ සහාය ද ලබාගත හැක.
එම ලියවිලි ලබා ගැනීමේ දී යොමු අංකයක් ද නිකුත් කළ යුතු වේ. එම ලියවිලි ස්කෑන් කර පද්ධතියට ඇතුළත් කිරීමටද ක්‍රියා කළ යුතුයි. මෙහිදී අයදුම්කරුට යොමු අංකයක් ලබාදී එසේ ලබා දෙන ලද යොමු අංකයද ඊට ඇතුළත් කළ යුතුයි. මෙම තොරතුරු පරිගනක පද්ධතියට ඇතුළත් කිරීමේ කාර්ය පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ මෙයට අමුණා ඇත. ලබාදෙන ලද යොමු අංකය සහිතව භෞතිකව එම ලියවිලි වෙනම ලිපි ගොනුවක ද වාර්තා කර තබා ගැනීමට එම ඒකකය තුළ පියවර ගත යුතුයි.

5.3 පද්ධතියට ඇතුළත් කර ඇති දත්ත හා ලියකියවිලි පරීක්ෂා කර ප්‍රාදේශීය ලේකම් විසින් පද්ධතිය හරහා අනුමැතිය ලබාදිය යුතුයි.

5.4. ප්‍රාදේශීය ලේකම් විසින් පරිගනක පද්ධතිය තුළින් ලියකියවිලි අනුමත කළ පසුව මෙම ප්‍රතිලාභ දීමනා අස්වැසුම පවුල් සඳහා විවෘත කර ඇති බැංකු ගිණුමක් මගින් ගෙවීම සඳහා සුබ සාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

Scanned with CamScanner

06. **දැනටමත් ප්‍රතිලාභ ලබමින් සිටින හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගී,ආබාධිත හා වැඩිහිටි පුද්ගලයින් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම :-**

6.1 වකුගඩු රෝගී දීමනාව, ආබාධිත දීමනාව හා ආබාධිත මහ ලේකම් කාර්යාලය මගිනුත් වැඩිහිටි පුද්ගලයින්ගේ දීමනාව වැඩිහිටි මහලේකම් කාර්යාලය මගිනුත් ගෙවීම් සිදු කරනු ලැබේ. එසේ ප්‍රතිලාභ ලබන පුද්ගලයින් අතරින් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ ආවරණය වූ පුද්ගලයින් හඳුනාගෙන ඉහත සඳහන් ආයතන මගින් එම පුද්ගලයන් වෙත කරනු ලබන දීමනා ගෙවීම අස්වැසුම දීමනා ගෙවීම යටතේ දීමනා ගෙවීම ආරම්භ වීමත් සමග එනම් 2024 අප්‍රේල් මස සිට අත්හිටවිය යුතුයි. අස්වැසුම වැඩසටහන යටතේ මෙම දීමනාව ගෙවීම 2024 අප්‍රේල් මස සිට සිදු කිරීමට නියමිත වේ. මේ සඳහා ප්‍රාදේශීය ලේකම්වරු විසින් සහතික කරන ලද 2024.01.01 දින සිට පුද්ගලයින්ගේ විස්තර අඩංගු ලැයිස්තුවක් මෙම මණ්ඩලය වෙත සහ ඉහත සඳහන් කළ අදාළ විෂය භාර ආයතන වෙත 2024 මාර්තු 25 දිනට පෙර ලබාදිය යුතුයි.

6.2 අස්වැසුම වැඩසටහන යටතේ තෝරා ගෙන ඇති පවුල්වලට අයත් වර්ග තුනට අයත් දීමනා ලබන පුද්ගලයින්, පොරොත්තු ලේඛනයේ පුද්ගලයින් ද ඇතුළුව පරිගණක පද්ධතිය තුළින් වෙන් කර හඳුනා ගෙන ප්‍රාදේශීය ලේකම්වරු වෙත දැන්වීමට ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව 2024 අප්‍රේල් මස සිට අස්වැසුම වැඩසටහනට පරිබාහිරව මෙම පුද්ගලයින් සඳහා කරනු ලබන මෙම දීමනාව ගෙවීම පමණක් අත්හිටවිය යුතුයි.

6.3 අස්වැසුම වැඩසටහනට ඇතුළත් නොවූ 2024.01.01 දිනට දීමනා ලබමින් සිටී සහ පොරොත්තු ලේඛනවල සිටී මෙම දීමනා සඳහා ද හිමිකම් ඇති පුද්ගලයන් සඳහා දැනට වලංගුව පවතින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබ ඇති ප්‍රතිපත්ති තීරණ අනුව දැනට පවත්නා ක්‍රම වේදය තුළම ප්‍රතිලාභ ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත වෙන් කර දී ඇති මූල්‍ය ප්‍රතිපාදන මගින් මුදල් අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් /වැඩිහිටි ලේකම් කාර්යාලය වෙත අදාළ පරිදි වෙන්කර දෙනු ඇත. මෙම ප්‍රතිලාභ ලැයිස්තුවට අලුතින් ප්‍රතිලාභී පුද්ගලයින් එකතු නොකළ යුතුයි.

6.4 දැනට දීමනා ලබන පුද්ගලයින් සඳහා ප්‍රතිලාභ දීමනා ගෙවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මාසිකව ඉල්ලුම් කිරීමේදී මරණ වැනි හේතු නිසා සුදුසුකම්ලාභී ලැයිස්තුවෙන් ඉවත් වන පුද්ගලයින්ගේ විස්තර අඩංගු ලැයිස්තුවක් ද ඉදිරිපත් කළ යුතුයි.

6.5 අස්වැසුම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන යම් සමාජ කාණ්ඩයක් තුළ මෙම දීමනා සඳහා සුදුසුකම් ලබන පුද්ගලයින් මිය යාම හෝ සුදුසකම් නොලැබීම හේතු නිසා නුසුදුසුසන් බවට පත්වූ විට එම තොරතුරු දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන කිරීම සඳහා 2024 අප්‍රේල් මස සිට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පියවර ගත යුතුයි.

ජයන්ත විජේරත්න
සභාපති /කොමසාරිස්

පිටපත් -

i. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ii. ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
iii. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය

Scanned with CamScanner